(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 88.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

## 2019 අගෝස්තු 20 වැනි අඟහරුවාදා අ.භා. 1.00 ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු එස්. වියාළේන්දිරන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයාගේ නිවේදන** : නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව '**මරණ දණ්ඩනය අහෝසි කිරීමේ**' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120 ව්‍යවස්ථාව ප්‍රකාරව යම් පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට තිබෙන අනුකූලබව ප්‍රකාශ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණමය බලයක් නොමැති හෙයින් මෙම පෙත්සම් තුන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.''

**II**

''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව **'නිවාඩු (සංශෝධන)'** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ යෝජනාකර ඇති සංශෝධන මඟින් නීති සම්පාදනයේ දී වඩාත් පැහැදිලිතාවයක් ගෙන දෙන බව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ වැඩිදුරටත් දක්වා ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2019 අංක 6 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2019.06.01 සිට 2019.07.15 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන පිළිගන්වා, එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්-

(i) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(ii) ශ්‍රී ලංකාවට ආනයනය කරන කිරිපිටිවල ප්‍රමිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු පිළිබඳ අතුරු වාර්තාව

පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) (128 අධිකාරය) කර්මාන්තශාලා ආඥාපනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 105 වගන්තිය යටතේ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සහ කර්මාන්තශාලා ගොඩනැගිලි සඳහා අනුමතිය ලබා දීම සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග;

(ii) (128 අධිකාරය) කර්මාන්තශාලා ආඥාපනතේ 34 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 105 වගන්තිය යටතේ හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග;

(iii) (128 අධිකාරය) කර්මාන්තශාලා ආඥාපනතේ 34, 35, 36, 36අ, 38 සහ 38අ වගන්ති සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 105 වගන්තිය යටතේ හුමාල බොයිලේරු සහ අනෙකුත් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග;

(iv) (128 අධිකාරය) කර්මාන්තශාලා ආඥාපනතේ 58අ වගන්ති සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 105 වගන්තිය යටතේ සේවකයන් අධික ශබ්දයෙන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග; සහ

(v) (128 අධිකාරය) කර්මාන්තශාලා ආඥාපනතේ 13 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 105 වගන්තිය යටතේ ආලෝක කිරීමේ පොදු සම්මත සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

පිළිගන්වා, එම නියෝග අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, **'2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග'** සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) ඉඹුල්ගොඩ, පහල ඉඹුල්ගොඩ, අංක 134/36 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඩබ්ලිව්. මාලනී මහත්මියගෙන් ලැබුණු 2019.05.27 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) පුහුල්වැල්ල, කිරින්ද, පාසල් මාවත, "කේසකි" යන ලිපිනයෙහි පදිංචි බී. එස්. විදානගේ මහතාගෙන් ලැබුණු 2019.07.08 දිනැති පෙත්සම;

(ii) සේරුනුවර, ආර්.බී.-03, අංක 292 දරන ස්ථානයෙහි පදිංචි ජී. රත්නසිරි මහතා සහ තවත් හතර දෙනෙකුගෙන් ලැබුණු 2019.07.08 දිනැති පෙත්සම; සහ

(iii) චීන වරාය, නුවර පාර, 5 කණුව, රේවත පටුමග යන ලිපිනයෙහි පදිංචි පී. ජී. චන්ද්‍රකාන්ති මහත්මියගෙන් ලැබුණු 2019.07.08 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) කළුතර, නාගොඩ, පැරණි ගුවන් තොටුපල පාර යන ලිපිනයෙහි පදිංචි ඒ. ඩී. චමින්ද කුමාර මහතාගෙන් ලැබුණු 2019.06.20 දිනැති පෙත්සම;

(ii) දෙනියාය, රෝහල අසළ, "බුද්ධි නිවස" යන ලිපිනයෙහි පදිංචි ඒ. එස්. ප්‍රසංග මහතාගෙන් ලැබුණු 2019.07.04 දිනැති පෙත්සම; සහ

(iii) බෝඹුවල, පාලයන්ගොඩ, රණවිරු ජයලත් ජයසිංහ මාවත යන ලිපිනයෙහි පදිංචි වයි. යූ. උපාලි කුලතුංග මහතාගෙන් ලැබුණු 2019.07.03 දිනැති පෙත්සම

ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කළුතර, රෙමුණගොඩ යන ලිපිනයෙහි පදිංචි ආර්. තිලකානන්ද මහතාගෙන් ලැබුණු 2019.06.07 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30(10) යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. එකතු කළ අගය මත බදු (සංශෝධන) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් 03 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් 03 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත** : දෙවැනිවර කියවීම

පනත් කෙටුම්පත, සභාවේ අවසර ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**9. බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග :** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 6, 9, 17, 18 සහ 25 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 204 වගන්තිය යටතේ ගීත හෝ සංගීතමය නිර්මාණවල හිමිකරුවන්ට කර්තෘභාග ගෙවීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කර ගැනීම සඳහා සහ සාමූහික සංගම් බලගැන්වීම සම්බන්ධයෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූනි 17 දිනැති අංක 2128/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.07.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

"ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි, රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.01 ට ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

"ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.00 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10 . ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, 53(3) පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ව්‍යවස්ථාදායක කාරක සභාවට පවරන ලදී.

**11. කල් තැබීම (නියඟයෙන් පීඩාවට පත් මහවැලි "එච්" කලාපයේ ගොවීන්ට සහන) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි, රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.51 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

"ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ගරු බිමල් රත්නායක මහතා, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 6.06 ට ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.32 ට, 2019 අගෝස්තු 21 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.